සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය - I පත්‍රය

**නම/විභාග අංකය :- ......................................................................** **කාලය : පැය 01 යි.**

- ❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- ❖ **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරැදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.**
- ❖ **දී ඇති පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ x ලකුණ යොදන්න.**

---

1. ෂිර්කුල් අක්බර් සඳහා වූ නිදසුනකි.
   1. ශාස්ත්‍ර ඇසීම
   2. අල්ලාහ් නොවන දෙයකට වැඳීම
   3. වෂී කිරීම
   4. අල්ලාහ් මත බොරු පොරොන්දු දීම

2. 'අයියාමුත් තෂ්රික්' දිනයන් අඩංගු වන මාසය
   1. ෂව්වාල්
   2. රමළාන්
   3. දුල් කඃදා
   4. දුල් හජ්

3. නව ගැටලු විසඳීම සඳහා ඉස්ලාම් විධිමත් කළ මාර්ගය
   1. ඉජ්තිහාද්
   2. මජ්ලිස්
   3. දඃවා
   4. ෂූරා

4. උපවාස රකින්නා ස්වර්ගයට පිවිසෙන පිවිසුම් මග
   1. බාබුස් සලාත්
   2. බාබුස්සකාත්
   3. බාබුස් සදකා
   4. බාබුර් රෛයියාන්

5. "ධෛර්ය" හිමි කර දෙන උල්පත වශයෙන් හැඳින්වෙන්නේ
   1. වීරත්වය
   2. ඊමාන්
   3. නිර්භීතභාවය
   4. ශාරීරික ශක්තිය

6. මුස්ලිම්වරුන්ගේ ප්‍රථම කිබ්ලාව වන මස්ජිදුල් අක්සා පිහිටා තිබෙන්නේ
   1. මක්කා
   2. පලස්තීනය
   3. කුෆා
   4. මදීනා

7. මිඃරාජ් සිදුවූ ක්‍රිස්තු වර්ෂය
   1. ක්‍රි.ව 615
   2. ක්‍රි.ව 630
   3. ක්‍රි.ව 620
   4. ක්‍රි.ව 610

8. "අහ්සනුල් ඛුලුක්" යනු
   1. නරක ගතිගුණ
   2. තරඟකාරී මානසිකත්වය
   3. හොඳ අදහස්
   4. යහගුණ

9. උමර් (රලි) ඉස්ලාම් සඳහා කළ සේවාවන් අතරින් එකකි

1. නාවික හමුදාව පිහිටුවීම
2. අල්කුර්ආනය ගොනු කිරීම
3. කුර්ආනය ආරක්ෂා කිරීම
4. බයිතුල්මාල් මහාභාණ්ඩාගාරය ස්ථාපිත කිරීම

10. ඉමාම මුස්ලිම් උපත ලැබූ ප්‍රදේශය

1. සිජිස්තාන්
2. කස්මීන්
3. නයිසාපූර්
4. සමර් කන්ද්

11. "අසදුල්ලාහ් " යනුවෙන් නබිතුමා විසින් හඳුන්වන ලද සහාබිවරයා

1. ජඃෆර් (රලි)
2. අලි (රලි)
3. අම්ර් (රලි)
4. කාලිද් බින් වලීද් (රලි)

12. ඉමාම් මාලික් තුමාගේ සිසුවෙකු ද, ඉමාම් අහ්මද් බින් හන්බල්ගේ ගුරුවරයෙකු ද වන ඉමාම්වරයා

1. ඉමාම් මුස්ලිම් (රහ්)
2. ඉමාම් අබූ හනීෆා (රහ්)
3. ඉමාම් සුහ්රි (රහ්)
4 ඉමාම් ෂාෆි (රහ්)

13. කලීෆා උමර් බින් අබ්දුල් අසීස් (රහ්) විසින් සංරක්ෂණය කරන ලද ෂරීආ ක්ෂේත්‍රය

1. තෆ්සීර්
2. ෆික්හු
3. හදීස්
4. තසව්වුෆ්

14. ප්‍රථම වහී පහළවන විට නබිතුමා ධ්‍යානයෙහි යෙදී සිටි ලෙන,

1. උහද්
2. හිරා
3. සිනායි
4. තෞර්

15. තවාෆ් යනු

1. මුස්දලිෆාහි රැඳීම
2. කෑබාව වම් දෙසට වට යාම
3. මිනාවෙහි රැඳීම
4. සෆා - මර්වා අතර සැහැල්ලු දිවීම

16. අබුබකර් (රලි) තම පාලන සමයෙහි මුහුණ පෑ ප්‍රධාන අභියෝගය

1. රටේ ඇති වූ ඉඩෝරය
2. රට තුළ මතුවූ ප්‍රචණ්ඩත්වය
3. ව්‍යාජ නබිවරු මතුවීම
4. පිටස්තරයන්ගේ ආක්‍රමණය

17. මහා පාපයක නිරත වූ මුස්ලිම්වරයා

1. මුෂ්රික් වේ.
2. ෆාසික් වේ.
3. මුර්තද් වේ.
4. මුල්හිද් වේ.

18. ලක්ෂ 6ක් හිමිකරගත් මුස්ලිම්වරයා වසර අවසානයේ දිය යුතු සකාත් ප්‍රමාණය

1. රු. 12000 කි
2. රු.12500 කි
3. රු.17500 කි
4. රු. 15000 කි

19. කුරුස යුධ සමයේ පලස්තීනය හා මස්ජිදුල් අක්සාව අත්පත්කර ජයග්‍රහණය කළ සෙන්පතියෙකු වන්නේ

1. තාරික් බින් සියාද්
2. මුහම්මද් බින් කාසිම්
3. සලාහුද්දීන් අල් අයියුබි
4. මූසා බින් නුසෛර්

20. විචාර බුද්ධිය පදනම් කරගෙන ක්‍රියාත්මක වූ අකීදා දාර්ශනික කණ්ඩායම

1. කවාරිජ්
2. මුතසිලා
3. ෂීආ
4. කද්රියියා

21. ඉස්ලාමීය අකීදාවෙහි පවිත්‍රතාවය රැකගැනීමෙහි ලා සෘජුවම සම්බන්ධ නොවූ ඉමාම්වරයා
1. අබුල් අසන් අල් අෂ්අරි (රහ්)
2. අබු ජඃෆර් අත්තාහාවි (රහ්)
3. අහ්මද් බින් හන්බල් (රහ්)
4. අබුල් හසන් අෂ්ෂාදුලි (රහ්)

22. සකාත් අනිවාර්ය වීම සඳහා වූ සඳහා වූ කොන්දේසි වලට අඩංගු නොවන්නේ
1. මුස්ලිම්වරයෙකු වීම
2. වසරක් සම්පූර්ණ වීම
3. නිසාබ් ප්‍රමාණය තිබීම
4. සුදුස්සන්ට ලබාදීම

23. ඉස්ලාමීය අකීදාව නිවැරදිව වටහා ගැනීමට පදනම් වන්නේ
1. ඊමාන් - ඉජ්මාඃ
2. ඊමාන් - හදීස්
3. කුර්ආන්-හදීස්
4. ඊමාන් - තව්හීද්

24. අල්ලාහ් පමණක් එකම දෙවියා ලෙස පිළිගෙන ඔහුට පමණක් නැමදීම
1. ඊමාන්
2. රිසාලත්
3. තෞහීද්
4. මආද්

25. "කුෆ්ර්" යන අරාබි පදයෙන් හැඳින්වෙන්නේ
1. ප්‍රතික්ෂේප කිරීම
2. කුහකකම
3. ආගම වෙනස් කිරීම
4. ආදේශ කිරීම

26. නබිතුමා සහ සහාභාවරුන්ගේ ජීවන මග අනුගමනය කරන්නන්
1. අහ්ලුල් බයිත්
2. අහ්ලුල් කිතාබ්
3. අහ්ලුල් ෆත්රත්
4. අහලුස් සුන්නාහ් වල් ජමාආ

27. අල් කුලෆාඋර් රාෂිදූන් යනු
1. මද්හබ් ඉමාම්වරු
2. ප්‍රථම කලීෆාවරු සිව්දෙනා
3. පිළේ මිතුරන්
4. ආගම් ලැබූවන්

28. නබිතුමා විසින් "සිද්දීක් " යන විරුදාවලියෙන් අමතනු ලැබූ සහාබිවරයා
1. අබ්දුල් රහ්මාන් (රලි)
2. අබුබක්ර් (රලි)
3. උස්මාන් (රලි)
4. අබ්බාස් (රලි)

29. සය දෙනෙක්ව නියම කර එම වියෝවයෙන් පසුව ඔවුන් අතරින් එක් අයෙක්ව කලීෆා වශයෙන් තොරාගත යුතු බව නියම කළේ
1. උමර් (රලි)
2. අබු බක්ර් (රලි)
3. අලි (රලි)
4. උස්මාන් (රලි)

30. උපවාසය විධිමත් කිරීම මගින් අපේක්ෂා කරන ආධ්‍යාත්මික ගුණාංගය
1. ආදරය
2. පරිත්‍යාගය
3. දේව බැතිය
4. දානමාන කිරීම

31. පහත සඳහන් කරුණු අතරින් හජ්හි ෆර්ලුවලට අඩංගු නොවන්නේ
1. අරෆාහි රැඳීම
2. සැහැල්ලු දිවීම
3. තවාෆුල් විදාඃ
4. හිස කෙස් ඉවත්කිරීම

32. හිජ්රි වසර 35 දී ඝාතනයට ලක්වූ කුලෆාඋර් රාෂිදූන් අතරින් අයෙකි.
1. උස්මාන් (රලි)
2. අලි (රලි)
3. උමර් (රලි)
4. අබුබක්ර් (රලි)

33. එහි මත්ලූව් පදනමින් බිහිවූ ෂරීආ නීති මූලාශ්‍රය

1. අස්සුන්නාහ්
2. අල් කියාස්
3. අල් - කුර්ආන්
4. අල් - ඉජ්මාඃ

34. නබිතුමාණෝ මස්ජිදුල් හරාම් සිට මස්ජිදුල් අක්සා දක්වා ගිය මැදියම් රෑ ගමන

1. මිඃරාජ්
2. හරකත්
3. හිජ්රත්
4. ඉස්රාඃ

35. "ෆික්හුල් අක්බර්" , "කිතාබුල් උම්මු" යන ග්‍රන්ථ දෙකෙහි කතෘවරු පිළිවෙලින්

1. ඉමාම් අබූ හනීෆා, ඉමාම් ෂාෆි
2. ඉමාම් මාලික්, ඉමාම් ෂාෆි
3. ඉමාම් අහ්මද් , ඉමාම් මාලික්
4. ඉමාම් ෂාෆි, ඉමාම් අහ්මද්

36. ඉබ්රාහිම් (අලෛ) තුමා ගින්නට දමන විට පැවසූ වදන් පෙළ

1. සුබ්හාන මලිකිල් කුද්දූස්
2. ලා හවුල වලා කුව්වත
3. හස්බියල්ලාහු වනිඃමල් වකීල්
4. ලා ඉලාහ ඉල්ලල්ලාහු රබ්බුල් අර්ෂිල් අලීම්

37. සකාත් ලැබීමට නොසුදුසු පුද්ගලයන්

1. අර්රිකාබ්
2. අහ්ලුල් බයිත්
3. ගාරිමූන්
4. ආමිල්

38. කාලීනව පවතින හිජ්රි වසර

1. 1438
2. 1437
3. 1439
4. 1436

39. 'අත්තවක්කුල්' යන් පදයෙහි අරුතය

1. භාරකිරීම
2. රැකීම
3. යටහත් බව
4. ඉවසීම

40. හජ් - උම්රා සඳහාවූ නියියත් තබන ආකාරයන් පහත (අ) , (ආ) තීරුවල සඳහන් කර තිබේ

| අ | ආ |
|---|---|
| 1. අත්තමත්තු ඃ | A. හජ්, උම්රා දෙකම එක්කර නියියත් තැබීම |
| 2. අල් - කිරාන් | B. හජ් සඳහා පමණක් නියියත් තැබීම |
| 3. අල් - ඉෆ්රාද් | C. ප්‍රථමයෙන් උම්රා ඉටුකර පසුව හජ් ඉටු කිරීමට නියියත් තැබීම |

'අ,' 'ආ' යන තීරු දෙක යාකිරීමෙන් ලබාගන්නා නිවැරැදි පිළිතුර

1. CAB
2. ACB
3. BAC
4. CBA

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2017

## 11 ශ්‍රේණිය
## ඉස්ලාම් ධර්මය - II පත්‍රය

**නම/විභාග අංකය :-** ............................................................................................ **කාලය : පැය 02 යි.**

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 බැගින් ද, අනෙකුත් එක් එක් ප්‍රශ්නයක් සඳහා ලකුණු 10 බැගින් ද හිමිවේ.**

(1) කෙටි පිළිතුරු සපයන්න

1. 'කුෆ්ර්' ඇති කරන ක්‍රියාමාර්ග දෙකක් නිදසුන් සමග නම් කරන්න.
2. ඉමාම් මාලික් හට හිමිවූ ගරු නාමය නම් කර, එතුමන්ගේ ප්‍රධාන කෘතියක්ද නම් කරන්න.
3. උපවාසය මගින් අපට හිමි කර ගත හැකි උසස් ගුණාංග දෙකක් සඳහන් කරන්න.
4. අලි (රලි) ගේ පාලන සමයෙහි මුස්ලිම්වරුන් අතර සිදු වූ සටන් දෙකක් නම් කරන්න.
5. පරිසරය හා බැඳෙන අපගේ වගකීම් අතරින් අප කළ යුතු යුතුකම් දෙකක් ලියන්න.
6. ෂිර්කුල් අස්කර් සඳහාවූ උදාහරණ දෙකක් ලියා දක්වන්න.
7. හල්ක් , හුලුක් යන පද දෙකෙහි අරුත් පහදන්න.
8. අවසාන දිනයෙහි සිදුවීමට නියමිත පෙරනිමිති අතරින් දෙකක් ලියන්න.
9. අල් - කුර්ආන් විග්‍රහ කරන මුෆස්සිවරයෙකුව නම් කර ඔහු විසින් රචිත තෆ්සීරයක් ද නම් කරන්න.
10. 'මස්ජිදුල් අක්සා' සිද්ධස්ථානය නිර්මාණ කටයුතුවල නිරත වූ නබිවරු දෙදෙනෙක් නම් කරන්න.

(ලකුණු 20)

(2) 1. ඊමානයට ප්‍රතිවිරුද්ධ අංගයන් නම් කරන්න.

2. අවසන් නබිත්වය සඳහා වූ තාර්කික සාක්ෂි දෙකක් සඳහන් කරන්න.

3. විකෘති අකීදා කණ්ඩායම් බිහිවීමට හේතු පහදන්න. (ලකුණු 10)

(3) 1. 'සකාත්' යන පදයෙහි භාෂාමය අරුත් පහදන්න.

2. උපවාසය මගින් අපි අත්කරගන්නා යහඵල විස්තර කරන්න.

3. හජ් සඳහා වූ ප්‍රධාන ස්ථාන නම් කර, එහි ඉටුකෙරෙන වතාවතයන් ද නම් කරන්න. (ලකුණු 10)

(4) 1. ආධ්‍යාත්මික දියුණුව සඳහා ගත යුතු ක්‍රියාමාර්ග නම් කරන්න.

2. සලාත් මගින් අත්කරගන්නා යහඵල කුමක්ද?

3. නබිතුමාගේ පාලන සමයෙහි ඉස්ලාම් සඳහා මස්ජිදුන් නබවි හි දායකත්වය පහදන්න. (ලකුණු 10)

(5) 1. අබූබක්ර් (රලි) තුමාගේ උත්සාහයේ ප්‍රතිඵල වශයෙන් ඉස්ලාමය වැළඳගත් මක්කා ප්‍රධානීන් සිව්දෙනෙක්ව නම් කරන්න.

2. අලි (රලි) තුමාගේ පෞරුෂීය ලක්ෂණ සඳහන් කරන්න.

3. කලීෆා උස්මාන් (රලි) ඉස්ලාමීය කිලාෆතය සඳහා කළ දායකත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(6) 1. වහිහී ප්‍රධාන කොටස් දෙක නිදසුන් සමග ලියන්න.

2. හදීස් ආරක්ෂා කිරීම සඳහා නබිතුමා ගත් ක්‍රියාමාර්ග සඳහන් කරන්න.

3. මුජ්තහිද්වරුන් සඳහා තිබිය යුතු සුදුසුකම් මොනවාද?

(ලකුණු 10)

(7) පහත සඳහන් මාතෘකාවන් අතරින් දෙකක් තෝරා කෙටි සටහන් ලියන්න.

1. අල් කුර්ආන් නීති මූලාශයක් වීමට හේතු

2. රිද්දත් හි ඵලවිපාක

3. 'සකාත්' මගින් අත්වන ඵලප්‍රයෝජන

4. සවුම්හි සුවිශේෂත්වය

(ලකුණු 10)